# BASIC CONCEPTS
# OF
# MANAGEMENT ACCOUNTING

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# පිරිවැය සංකල්ප

## පිරිවැය

භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට හෝ සේවාවක් ලබා ගැනීම සඳහා හෝ කැප කළ සම්පත්වල මුදල්මය වටිනාකමයි.

## පිරිවැය ඒකකය

පිරිවැය මැනීම සඳහා භාවිතයට ගනු ලබන, කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් මැනීම සඳහා වන ඒකකය, පිරිවැය ඒකකය වේ.

## පිරිවැය මධ්‍යස්ථානය

පිරිවැය හඳුනා ගැනීමට සහ පිරිවැය කළමනාකාරිත්වයට සම්බන්ධ වන පිරිවැය ඒකකවලට අදාළ කිසියම් ස්ථානයක්, කාර්යයක්, උපකරණයක්, පුද්ගලයෙක්, පිරිවැය මධ්‍යස්ථානයක් වේ.

ClassWork.LK

# පිරිවැය වර්ග කිරීම

කළමනාකරණ අවශ්‍යතා මත පිරිවැය වර්ග කිරීම පහත සඳහන් පරිදි සිදු කළ හැකි ය.

## තොග තක්සේරු පරමාර්ථය සඳහා පිරිවැය වර්ග කිරීම

තොග ඇගයීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගන්නේ පිරිවැය ගිණුම්කරණ ක්ෂේත්‍රයෙන් වේ. ඒ අනුව පහත පරිදි පිරිවැය වර්ග කෙරේ.

1) **නිෂ්පාදන පිරිවැය**
2) **කාලච්ඡේද පිරිවැය**

ClassWork.LK

## 1) නිෂ්පාදන පිරිවැය

නිෂ්පාදන පිරිවැය යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා දරන ලද මුළු පිරිවැයයි.

මෙහි දී නිෂ්පාදන ඒකකයක් සමග පැහැදිලිව වෙන් කර හඳුනා ගත හැකි නිෂ්පාදන ඒකක ප්‍රමාණය වෙනස් වීමට සාපේක්ෂව වෙනස් වන පිරිවැය නිෂ්පාදන සෘජු පිරිවැය (ප්‍රාථමික පිරිවැය) වේ.

නිෂ්පාදන ඒකක ප්‍රමාණය වෙනස් වීමට සාපේක්ෂව වෙනස් නොවන පිරිවැය වක්‍ර නිෂ්පාදන පිරිවැය (නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය) වේ.

## 2) කාලච්ඡේද පිරිවැය

කිසියම් ගිණුම් කාලච්ඡේදයක ආදායමට එරෙහිව ලාභ අලාභ ගිණුමට (ආදායම් ප්‍රකාශනයට) හර කරන පිරිවැය කාලච්ඡේද පිරිවැය වේ.

ClassWork.LK

## පිරිවැය හැසිරෙන ආකාරය අනුව පිරිවැය වර්ග කිරීම

ආයතනයක කළමනාකරණය විසින් තීරණය කරන සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහාත්, අයවැය පිළියෙල කිරීම හා ලාභ සැලසුම් කිරීම සඳහාත්, මූල්‍ය පාලනය සඳහාත් පිරිවැය හැසිරෙන ආකාරය අනුව පිරිවැය පහත පරිදි වර්ග කෙරේ.

1) **විචල්‍ය පිරිවැය හා ස්ථාවර පිරිවැය**
2) **අදාළ පිරිවැය හා අදාළ නොවන පිරිවැය**
3) **ගිලුණු පිරිවැය**
4) **ආවස්ථික පිරිවැය**

ClassWork.LK

## 1) විචල්‍ය පිරිවැය හා ස්ථාවර පිරිවැය

## විචල්‍ය පිරිවැය

නිෂ්පාදන හෝ විකුණුම් ඒකක ප්‍රමාණය වෙනස් වීමට සාපේක්ෂව සෘජු අනුපාතයකින් වෙනස් වන පිරිවැය, විචල්‍ය පිරිවැය වේ.

නිෂ්පාදන ඒකකයක විචල්‍ය පිරිවැය ස්ථාවර අගයක් ගන්නා අතර, නිෂ්පාදන හෝ විකුණුම් ඒකක ප්‍රමාණය වෙනස් වීමත් සමග මුළු විචල්‍ය පිරිවැය වෙනස් වේ.

## ස්ථාවර පිරිවැය

ගිණුම් කාලච්ඡේදයේ දී දරන ලද, නිෂ්පාදන හෝ විකුණුම් මට්ටම වෙනස්වීමත් සමග වෙනස් නොවන පිරිවැය, ස්ථාවර පිරිවැය වේ.

මුළු ස්ථාවර පිරිවැය වෙනස් නොවී තිබුණ ද නිෂ්පාදන ඒකක හෝ විකුණුම් ඒකක සංඛ්‍යාව වෙනස් වීමත් සමඟ ඒකකයට බෙදී යන සාමාන්‍ය ස්ථාවර පිරිවැය වෙනස් වේ.

ClassWork.LK

## 2) අදාළ පිරිවැය හා අදාළ නොවන පිරිවැය

කිසියම් තීරණයක් ගැනීමට සෘජුව ම අදාළ වන පිරිවැය අදාළ පිරිවැය වේ. අදාළ වන පිරිවැය යටතේ සාකච්ඡා නොවන සියල්ල අදාළ නොවන පිරිවැය වේ.

## 3) ගිලුණු පිරිවැය

අතීතයේ දී ගනු ලැබූ තීරණයක ප්‍රතිඵලයක් ලෙස දැනටමත් දරා ඇති තීරණ ගැනීම සම්බන්ධයෙන් වැදගත් නොවන පිරිවැය, ගිලුණු පිරිවැය වේ.

## 4) ආවස්ථික පිරිවැය

යම් විකල්ප ක්‍රියාමාර්ගයක් තෝරා ගැනීම නිසා කැප කරන ඊළඟ හොඳම විකල්ප ක්‍රියාමාර්ගයේ ප්‍රතිලාභ, ආවස්ථික පිරිවැය වේ.

Classwork.LK

## පාලන කාර්ය සඳහා පිරිවැය වර්ග කිරීම

1) පාලනය කළ හැකි පිරිවැය

2) පාලනය කළ නොහැකි පිරිවැය

### 1) පාලනය කළ හැකි පිරිවැය

තම වගකීම් පරාසය තුළ සාධාරණ ලෙස හැසිරවීම සිදු කළ හැකි පිරිවැය, පාලනය කළ හැකි පිරිවැය වේ.

### 2) පාලනය කළ නොහැකි පිරිවැය

තම වගකීම් පරාසය තුළ හැසිරවීම කළ නොහැකි පිරිවැය, පාලනය කළ නොහැකි පිරිවැය වේ.

ClassWork.LK

# අභ්‍යාසය

1) පහත සඳහන් ඒවායෙන් ''පිරිවැය ඒකකයක්'' වන්නේ කුමක් ද යන්න සඳහන් කරන්න.

- පාන් බේකරියක
- රෝහලක
- විදුලිය සපයන ආයතනයක
- සිනමා ශාලාවක

2) පියල් වර්ෂයකට 12% බැගින් පොලී ලැබෙන රු. 400 000 ක ස්ථාවර තැන්පතුව ඉවතට ගෙන 2022. 01. 01 දින ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කළ අතර, තම ව්‍යාපාරික නාමය 'දැව ශක්ති' යන නමින් ලියාපදිංචි කිරීමේ දී රු. 2500 ක් වැය කර ඇත. ලී බඩු නිපදවීමේ කාර්යය සඳහා,

- රු. 80 000 ක යන්ත්‍ර උපකරණ මිල දී ගැනීම
- රු. 8000 මාසික කුලිය සඳහා ගොඩනැගිල්ලක් ලබා ගැනීම

ClassWork.LK

- වැඩ නිම කළ පසු මේසයක් සඳහා රු. 3 000ක ගාස්තුවක් ගෙවීම මත වඩු කාර්මිකයකු යොදවා ගැනීම

- මේසයක් සඳහා දැව වර්ග අඩි 18ක් අවශ්‍ය වන අතර, වර්ග අඩියක් රු. 200 බැගින්, දැව වර්ග අඩි 400ක් ලබා ගැනීම

- කම්හල් රක්ෂණ සහ විදුලිය සඳහා රු 18 000ක් වැය කිරීම

- වැලි කඩදාසි, පොලිෂ් ආදිය සඳහා රු. 4 000ක් වැය කිරීම

- යන්ත්‍ර උපකරණ සඳහා (මාස 03ක්) රු. 3 000ක් ක්ෂය වීම් ඇතුළත් කිරීම

- වෙනත් කම්හල් වියදම් සඳහා රු. 19 000ක් ඇතුළත් කිරීම සිදු කර ඇත.

- 2022. 03. 31 දිනෙන් අවසන් වූ කාර්තුව තුළ දී මේස 20ක් නිපදවා මේස 15ක් අලෙවි කර ඇත.

ClassWork.LK

දී ඇති තොරතුරුවලට අනුව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) නිෂ්පාදන පිරිවැය හා කාලච්ඡේද පිරිවැය කොපමණ ද?

ii) 2022. 03. 31 දිනට ඉතිරි බඩු තොගයේ (අමුද්‍රව්‍ය තොගය හා නිමි තොගය) වටිනාකම දක්වන්න.

iii) විචල්‍ය පිරිවැය හා ස්ථාවර පිරිවැය වෙන වෙනම ගණනය කරන්න.

3) පහත සඳහන් දෑ උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

- අදාළ නොවන පිරිවැය
- ගිලුණු පිරිවැය
- ආවස්ථික පිරිවැය

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura